**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2021 (2022)**

**කතෝලික ධර්මය 1**

**ප්‍රශ්න**

---

**සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

01. පුරාණ ගිවිසුමට අයත් ජනප්‍රිය කෘතියකි,
(1) ජෝබ් (2) යෙසායා (3) එස්තර් (4) දානියෙල්

02. ශුද්ධ වූ පාවුලු තුමා විසින් ම රචනා කරන ලද සංදේශ දෙකක් වන්නේ,
(1) එපීස හා හෙබ්‍රෙව් ය. (2) ගලාති හා පිලිප්පි ය.
(3) රෝම හා පේදුරු ය. (4) පිලොමොන් හා ජාකොබ් ය.

03. ''දේව ආදරයේ හා ක්‍රිස්තුන් වහන්සේගේ කීකරුකමේ සංකේතය කුරුසිය යි'' යනුවෙන් ප්‍රකාශ කළේ,
(1) ශුද්ධ වූ ජූද් තුමා ය. (2) ශුද්ධ වූ පාවුලු තුමා ය.
(3) ශුද්ධ වූ ජාකොබ් තුමා ය. (4) ශුද්ධ වූ ජොහන් තුමා ය.

04. ගිබියොන්හි දී දෙවි සමිඳාණන් ස්වප්නයකින් සලමොන් රජතුමාට දර්ශනය වූ විට, රජතුමා එතුමාණන්ගෙන් ඉල්ලා සිටියේ,
(1) දරු සම්පත් ය. (2) දීර්ඝායුෂ ය. (3) ධන සම්පත් ය. (4) ඥානවන්ත සිතක් ය.

05. ජේසුස් වහන්සේ කුරුසය මත දී වදාළ ''පියාණනි, ඔබගේ හස්තයට මාගේ ප්‍රාණය බාර දෙමි'' යන්න සඳහන් කරන සුවිශේෂකවරයා වනුයේ,
(1) ශුද්ධ වූ ලූක් තුමා ය. (2) ශුද්ධ වූ මාර්ක් තුමා ය.
(3) ශුද්ධ වූ ජොහන් තුමා ය. (4) ශුද්ධ වූ මතෙව් තුමා ය.

06. ශුද්ධ වූ සභාවේ උපන් දිනය ලෙස සලකනු ලබන්නේ,
(1) පෙන්තකොස්ත දිනය යි. (2) නත්තල් දිනය යි.
(3) මහා බ්‍රහස්පතින්දා දිනය යි. (4) පාස්කු ඉරිදා දිනය යි.

07. අපෝස්තුළුවරුන් දොළොස් දෙනා අතුරෙන් පළමු ප්‍රාණ පරිත්‍යාගිවරයා වූයේ,
(1) ශුද්ධ වූ ජොහන් තුමා ය. (2) ශුද්ධ වූ ජාකොබ් තුමා ය.
(3) ශුද්ධ වූ පේදුරු තුමා ය. (4) ශුද්ධ වූ පිලිප් තුමා ය.

08. ශුද්ධ වූ පාවුලු තුමා අයත් වූ ගෝත්‍රය වන්නේ,
(1) ලෙවී ය. (2) ජුදා ය. (3) රූබන් ය. (4) බෙන්ජමින් ය.

09. තුන්වන ධර්මදූත චාරිකාවෙන් පසු ශුද්ධ වූ පාවුලු තුමා නැවතී සිටියේ,
(1) ගලාතියෙහි ය. (2) ජෙරුසලමෙහි ය. (3) අන්තියෝකියෙහි ය. (4) තෙසලෝනිකයෙහි ය.

10. පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් පේදුරු තුමන් විසින් කරන ලද ප්‍රකාශ පමණක් ඇතුළත් වරණය තෝරන්න.
A - ''ඔබ රාජශ්‍රීයෙන් වඩින කල මා සිහි කළ මැනව''
B – ''මා ඔබට ප්‍රේම කරන බව ඔබ දන්නා සේක''
C – ''එහෙත් ඔබ කියන සේක් නම් දැල් හෙළමි''
D – ''ස්වර්ගයෙහි යතුර මම ඔබට දෙන්නෙමි''

(1) A හා B (2) A හා C (3) B හා C (4) B හා D

11. VII වන බුවනෙකබාහු රජතුමාගේ ඉල්ලීම පරිදි ක්‍රි ව 1543 දී ශ්‍රී ලංකාවට පැමිණි ධර්මදූත කණ්ඩායම අයත් වූ නිකාය වන්නේ,
(1) ජේසු නිකාය යි. (2) අගොස්තීනු නිකාය යි.
(3) දොමිනිකාන නිකාය යි. (4) ප්‍රැන්සිස්කාන නිකාය යි.

12. ශ්‍රී ලංකා ශුද්ධ වූ සභා ඉතිහාසය බෙදෙන ප්‍රධාන යුග ,
(1) 3 කි. (2) 4 කි. (3) 5 කි. (4) 6 කි.

13. කතෝලික ජන වන්දනාවේ කේන්ද්‍රස්ථානය මෙන් ම අග්‍රස්ථානය ද හිමි වන්නේ ,
(1) පූජකවරයට ය. (2) ප්‍රසාද ස්නාපනයට ය.
(3) ආශිර්වාදකාර බන්ධනයට ය. (4) දිව්‍ය සත්ප්‍රසාද වහන්සේට ය.

14. ''උන්වහන්සේ එළුවන්ගේත්, වස්සන්ගේත් ලෙයින් නොව, තමන්ගේ ම ලෙයින් අප උදෙසා සදාතනික විමුක්තිය ලබා සඳහට ම එකවරක් ශුද්ධ ස්ථානයට ඇතුළු වූ සේක'' මෙසේ සඳහන් වන සංදේශය ලියන ලද්දේ,
(1) හෙබ්‍රෙව්වරුන්ට ය. (2) ගලාතිවරුන්ට ය.
(3) කොරින්තිවරුන්ට ය. (4) තෙසලෝනිකවරුන්ට ය.

15. වන්දනීය ජුසේ වාස් පියතුමා ව භාග්‍යවරයට ඔසවන ලද්දේ,
(1) පළමු වන ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමන් විසිනි.
(2) පළමු වන ජුවාම් පාවුලු ශුද්ධෝත්තම පියතුමන් විසිනි.
(3) දෙවන වන ජුවාම් පාවුලු ශුද්ධෝත්තම පියතුමන් විසිනි.
(4) දහසය වන බෙනඩික් ශුද්ධෝත්තම පියතුමන් විසිනි.

16. ''පියවරුනි, ඔබේ දරුවන් කෝප නො කරන්න. එසේ නො කර ඔවුන් සමිඳාණන් වහන්සේ තුළ විනයෙන් ද අවවාදයෙන් ද ඇති දැඩි කරන්න.'' මෙම පාඨය උපුටාගෙන ඇත්තේ,

(1) හිතෝපදේශ පොතෙනි. (2) උපදේශකයාගේ පොතෙනි.
(3) කොලොස්සිවරුන්ට ලියන ලද සංදේශයෙනි. (4) එපීසවරුන්ට ලියන ලද සංදේශයෙනි.

17. සමඟි සන්ධාන ප්‍රසාද නිධානයේ දී සමාව දීම සඳහා පූජා ප්‍රසාදිතුමෙකු විසින් තම රදගුරුතුමාගෙන් විශේෂ අවසරයක් ලබා ගත යුතු පාපය,
(1) ගබ්සා කිරීම ය. (2) අසරණයන් කොන් කිරීම ය.
(3) බෝවන රෝග බෝ කිරීම ය. (4) දිවි නසා ගනීමට තැත් කිරීම ය.

18. ශුද්ධ වූ පාවුලු තුමා දක්වන පරිදි කිසිවෙකු තම ශරීරයට විරුද්ධ ව කරන පාපය,
(1) බොරු කීම ය. (2) සොරකම ය. (3) ක්‍රෝධය ය. (4) අනාචාරය ය.

19. හත්වන සහ දසවන පනත්වලට විරුද්ධ පාපයක් වනුයේ,
(1) මව්පියන්ට නො සැළකීම ය.
(2) මර්යාදාවයට විරුද්ධ ව කටයුතු කිරීම ය.
(3) අනුන්ගේ කාලය නාස්ති කිරීම ය.
(4) වෙනත් දෙවිවරුන් නමස්කාර කිරීම ය.

20. ජේසුස් වහන්සේ විසින් ඔප්පු කරන ලද 'උත්තම පූජක යාච්ඤාවෙහි' ඇතුළත් ශ්‍රාවකයින් වෙනුවෙන් කරන ලද යාච්ඤාවෙන් අපේක්ෂා කරන ලද්දේ,
(1) ඔවුන් ආරක්ෂා කරන ලෙස ය. (2) ඔවුන්ට මඟ පෙන්වන ලෙස ය.
(3) ඔවුන්ගේ වැරදි කමා කරන ලෙස ය. (4) ඔවුන්ගේ සංඛ්‍යාව වැඩි කරන ලෙස ය.

21. අනුශාසනාත්මක භාෂා ශෛලියක් දක්නට ලැබෙන දේව ධාර්මික සම්ප්‍රදාය කුමක් ද?
(1) යාවේ සම්ප්‍රදාය (2) එලොහිම් සම්ප්‍රදාය
(3) ද්වීතීය නීති සම්ප්‍රදාය (4) පූජක සම්ප්‍රදා ය

22. ද්වීතීය සම්මත ග්‍රන්ථ පමණක් ඇතුළත් වරණය තෝරන්න.
(1) ජූදිත්, තෝබිත්, බාරුක් සහ උපදේශකයා.
(2) ජූදිත්, බාරුක්, ගීතාවලිය සහ ජෝබ්.
(3) ජූදිත්, තෝබිත්, රාජාවලිය සහ සලමොන්ගේ ප්‍රඥාව.
(4) ජූදිත්, බාරුක්, ධර්ම දේශකයා සහ නෙහෙමියා.

23. පහත සඳහන් ලක්ෂණ අතුරෙන් දේශක (පෙර) දිවැසිවරුන්ගේ ලක්ෂණ පමණක් අඩංගු වරණය තෝරන්න.
A – ධ්‍යානයට සම වැදීම
B – සෙරප්වරුන් මගින් ක්‍රියා කිරීම

C – කණ්ඩායම් වශයෙන් මෙහෙවරෙහි යෙදීම
D – තනි පුද්ගලයෙකු වශයෙන් පමණක් මෙහෙවරෙහි යෙදීම
(1) A හා B (2) A හා C (3) A හා D (4) B හා C

24. දෙවියන් වහන්සේගේ පණිවිඩය සංකේතාත්මක ව ලබා දුන්නේ කා හට ද?
(1) මීකා දිවැසිවරයාට (2) එලියා දිවැසිවරයාට
(3) යෙසායා දිවැසිවරයාට (4) එසකියෙල් දිවැසිවරයාට

25. ශුද්ධ වූ මාක් තුමාගේ සුබාරංචිය ආරම්භ වන්නේ,
(1) ස්නාවක ජොහන් තුමා පාළුකරයේ සිදුකළ දේශනයෙනි.
(2) ජේසුස් වහන්සේගේ ධර්මදූත සේවයෙනි.
(3) සෙකරියස් තුමාගේ යාග පූජාවෙනි.
(4) ජේසුස් වහන්සේගේ වංශාවලිය ඉදිරිපත් කිරීමෙනි.

26. යාච්ඤාවෙන් හෝ අන් අයට උපකාර කිරීමෙන් හෝ දෙවිඳුන් අත්දැකීමට අපට ආරාධනා
කරන සුබාරංචිය කුමක් ද?
(1) ශුද්ධ වූ මාක් සුබාරංචිය (2) ශුද්ධ වූ මතෙව් සුබාරංචිය
(3) ශුද්ධ වූ ලූක් සුබාරංචිය (4) ශුද්ධ වූ ජොහන් සුබාරංචිය

27. ''පොළොවේ නුඹට කටු පඳුරු ද, වල් පැළෑටි ද උපදින්නේ ය'' දෙවියන් වහන්සේ විසින් මෙසේ වදාළේ කා හට ද?
(1) කායින්ට (2) ආදම්ට (3) මෝසෙස්ට (4) ආබෙල්ට

28. දෙවියන් වහන්සේ මෝසෙස් තුමාට දර්ශනය වූයේ,
(1) ජීවමාන සත්ත්වයෙකු ලෙසිනි. (2) ඝන අන්ධකාරයක් ලෙසිනි.
(3) ගිනිගත් නො දැවෙන පඳුරේ දැල්ල ලෙසිනි. (4) දේවදූතයෙකු ලෙසිනි.

29. මිසර වැසියන් මුහුණ දුන් දස උවදුරු අතුරෙන් අවසාන උවදුරු දෙක වූයේ,
(1) මැඩි උවදුර හා වතුර ලේ වීමයි.
(2) කිනිතුලු උවදුර හා කුළුඳුලන්ගේ මරණයයි.
(3) ගඩු උවදුර හා ගල් වර්ෂා උවදුරයි.
(4) ගනඳුරු උවදුර සහා කුළුඳුලන්ගේ මරණයයි.

30. ඉශ්රායෙල් ජනතාව ................ මඟින් දේව ජනතාවක් වූවා සේ ම, අපි ද ................ තුළින් දේව දරුවෝ වූයෙමු,
හිස්තැනට සුදුසු පිළිතුරු අනුපිළිවෙළට සඳහන් වන වරණය තෝරන්න.
(1) සීනයි ගිවිසුම, ප්‍රසාද ස්නාපනය. (2) සීනයි ගිවිසුම, අභිවෘද්ධි ආලේපය.
(3) ප්‍රසාද ස්නාපනය, සීනයි ගිවිසුම. (4) චර්මඡේදනය, සීනයි ගිවිසුම.

31. යුක්තිය සහ සාධාරණත්වය වෙනුවෙන් එඩිතර ව කථා කළ නිසා මරණය හිමි වූයේ කා හට ද?

(1) ජෝනා දිවැසිවරයාට (2) එසකියෙල් දිවැසිවරයාට
(3) ආබෙල්ට (4) ස්නාවක ජොහන් තුමාට

32. පසුම්බියක් හෝ මල්ලක් හෝ පාවහන් හෝ රැගෙන නො යන ලෙසට ජේසුස් වහන්සේ තම ශ්‍රාවකයන්ට උපදෙස් දුන්නේ ධර්මදූත සේවයෙහි යෙදෙන්නන්ට ලැබෙන ............... පෙන්වා දීමට ය.

(1) මඟ පෙන්වීම (2) ආත්මීක සුවය (3) දිව්‍ය සංරක්ෂණය (4) දේව ප්‍රශංසා

33. ශුද්ධ වූ ලූක් සුබාරංචියේ 17:20-25 ට අනුව දේව රාජ්‍යය,

(1) අප අතරෙහි ඇත. (2) දිළින්දන් අතරෙහි ඇත.
(3) කොන් වූ අය අතරෙහි ඇත. (4) පොහොසතුන් අතරෙහි ඇත.

34. ආශිර්වාදකාර බන්ධනය නමැති දේව ප්‍රසාද නිධානයේ බාහිර සළකුණ කුමක් ද?

(1) ශුද්ධ වූ තෛලය (2) විවාහ පොරොන්දුව
(3) මුදු මාරු කිරීම (4) මාලය පැළඳවීම

35. ''පසුතැවී සිත හරවා ගැනීමට වුවමනා නැතැයි සිතන සිල්වතුන් අනූ නව දෙනෙකුට වඩා, පසුතැවී සිත හරවා ගන්නා .............. ඇති වන්නේ ය'' ලූක් 15:7 අනුව හිස්තැනට සුදුසු පිළිතුර කුමක් ද?

(1) එක මනුෂ්‍යයෙකු තුළ යහපත
(2) එක පව්කාරයෙකු ගැන ස්වර්ගයෙහි ප්‍රීතිය
(3) අයට දෙවියන් වහන්සේ සමඟ මිත්‍රත්වය
(4) අයට දෙවියන් වහන්සේගේ දරුවෙකු ලෙස ප්‍රීතිය

36. පැවිදි ජීවිතයේ ලක්ෂණ පමණක් ඇතුළත් වරණය තෝරන්න.

(1) ව්‍රත ශුද්ධිය, කීකරුකම සහ දිළිඳුකම
(2) ව්‍රත ශුද්ධිය, සාංඝික ජීවිතය සහ තාපස ජීවිතය
(3) සාංඝික ජීවිතය, දිළිඳුකම සහ සේවයේ ජීවිතය
(4) සාංඝික ජීවිතය, යාච්ඤාවේ ජීවිතය සහ සේවයේ ජීවිතය

37. ක්‍රිස්තුන් වහන්සේ විසින් අපෝස්තුළුවරුන්ට පවරන ලද දූත සේවාව බාරගත් කිතුනුවන්ට ලැබුනේ,

(1) නිල පූජකවරයයි. (2) පොදු පූජකවරයයි.
(3) දිවැසිවර කාර්යයයි. (4) එඩේරික කාර්යයයි.

38. ජේසුස් වහන්සේ අපට දක්වන ප්‍රේමයට ප්‍රතිප්‍රේමය දැක්වීම සඳහා උන්වහන්සේ විසින් ම ස්ථාපිත කළ ශුද්ධවන්තභාවය බාධාවකින් තොර ව අඛණ්ඩ ව පවත්නා ප්‍රබල ගිහි අපෝස්තලික සේවාවක් වන්නේ,

(1) කිතුදන පුබුදුවයි. (2) ජේසුස් වහන්සේගේ දිව්‍ය හෘදයේ සමිතියයි.

(3) තරුණ ක්‍රිස්තියානි ශිෂ්‍ය ව්‍යාපාරයයි. (4) වින්සන් ද පාවුලා සමිතිය යි.

39. මරියෝත්තමාවන්ගේ මෙලොව ජීවිතය අවසානයේ දී දෙවියන් වහන්සේ ඕ තොමෝවන් ස්වර්ගයට ඔසවා ගැනීම හඳුන්වනු ලබන්නේ,

(1) මාංශගතවීම යනුවෙනි. (2) ස්වරගාරෝපණය යනුවෙනි.

(3) ස්වරගාරෝහණය යනුවෙනි. (4) ජම්ම දෝෂයෙන් නිර්දෝෂ වීම යනුවෙනි.

40. මරිය තුමිය දහඅට වතාවක් දර්ශනය වී ජපමාල භක්තියේ උතුම්කම පෙන්වා දුන්නේ,

(1) ලූර්දු නුවර ලුසී තුමියට ය.

(2) පාතිමා නුවර බර්නදෙත් තුමියට ය.

(3) ලූර්දු නුවර බර්නදෙත් තුමියට ය.

(4) පාතිමා නුවර ජසින්තා තුමියට ය.

## කතෝලික ධර්මය-II

**කෙටි පිළිතුරු ලියන්න.**

1. i. අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොතෙහි අන්තර්ගතයේ කොටස් **දෙකක්** ලියන්න.

ii. ශුද්ධ වූ සභාව තුළ පැවතිය යුතු අනිවාර්ය ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.

iiii. දිව්‍ය සත්ප්‍රසාද භෝජනයේ දී සක්‍රමේන්තු ආකාරයෙන් අප ලබා ගන්නේ කුමක් දැයි ලියන්න.

iv. ඉඩමක් විකුණා ලබා ගත් මුදල් පිළිබඳ ව පේදුරු තුමන් රැවටීම නිසා මරණයට පත් වූ **දෙදෙනා** නම් කරන්න.

v. පුදසුන සූදානම් කිරීමේ පිළිවෙතට අයත් අනු කොටස් **දෙක** ලියන්න.

vi. දෙවියන් වහන්සේ ආබ්‍රහම් සමග ඇතිකර ගත් ගිවිසුමේ ප්‍රධාන කරුණු **දෙක** ලියන්න.

vii. ප්‍රසාද ස්නාපනයේ දී ප්‍රකාශ කරනු ලබන පොරොන්දු **දෙක** ලියන්න.

viii. දේව රාජ්‍යයේ වටිනාකම් පිළිබඳ ව සඳහන් වන උපමා **දෙකක්** නම් කරන්න.

ix. එක්වරු ශීලය රැකීමේ පරමාර්ථ **දෙකක්** ලියන්න.

x. ජන වන්දනා වසර තුළ දේවමාතාවන්ගේ මංගල්‍යය **දෙකක්** සඳහන් කරන්න.

2. i. කතෝලික සභාව අනුගමනය කරන සහ උගන්වන කරුණු ලැබී ඇති මූලාශ්‍ර **දෙක** නම් කරන්න.

ii. පංච පුස්තකයට අයත් පොත් **තුනක්** නම් කරන්න.

iii. නායකයෙකු වශයෙන් ඔබ කටයුතු කරන ආකාරය දස පනතේ පනත් **පහක්** ඇසුරින් කෙටියෙන් විස්තර කරන්න.

3. i. පෙන්තකොස්ත මංගල්‍යයේ දී ජුදෙව්වන් විසින් කරන ලද විශේෂ ක්‍රියා **දෙකක්** ලියන්න.

ii. මුල් කිතුනු සභාවේ සුවිශේෂ ලක්ෂණ **තුනක්** ලියන්න.

iii. ඔබේ දේවස්ථාන මංගල්‍යයක දී ඔබට සිදු කළ හැකි යහපත් ක්‍රියා **පහක්** කෙටියෙන් විස්තර කරන්න.

4. i. ගෙත්සමනි මල් උයනේ යාච්ඤාවෙන් පෙන්නුම් කරන කරුණු **දෙකක්** ලියන්න.
ii. ගෙත්සමනි මල් උයනේ දී ජේසුස් ක්‍රිස්තුන් වහන්සේට ආසන්නයේ සිට යාච්ඤා කිරීමට උන්වහන්සේගෙන්
උපදෙස් ලැබූ අපෝස්තුළුවරුන් **තිදෙනාගේ** නම් ලියන්න.
iii. දුර්පරීක්ෂාවලින් ජය ගැනීමට අවශ්‍ය ශක්තිය ඉල්ලා නිර්මාණය කරන පෞද්ගලික යාච්ඤාවක අඩංගු විය යුතු
කරුණු **පහක්** ලියන්න.

5. i. ස්නාවක ජොහන් තුමා පිළිබඳ ව පැරණි ගිවිසුමේ මලාකි 3:1 හා නව ගිවිසුමේ ලූක් 1:6 හි සඳහන් වූ
කරුණු **දෙක** ලියන්න.
ii. ස්නාවක ජොහන් තුමාගෙන් උපදෙස් ලැබූ කණ්ඩායම්වලට එතුමා දුන් අවවාද **තුනක්** සඳහන් කරන්න.
iii. ස්නාවක ජොහන් තුමාගේ ජීවිතයෙන් අද සමාජයේ ජන නායකයින්ට ගත හැකි ආදර්ශ **පහක්** විස්තර
කරන්න.

6. i. මතෙව් 5:44 අනුව ස්වර්ගයෙහි වැඩ වසන ඔබේ පියාණන් වහන්සේගේ පුත්‍රයන් වන්නට කළ යුතු ක්‍රියාවන්
**දෙකක්** ලියන්න.
ii. යුද්ධය පිටුදැකීම පිළිබඳ ව කතෝලික සභාව උගන්වන කරුණු **තුනක්** සඳහන් කරන්න.
iii. වර්තමාන සමාජය 'සාම මාවතක් කරා' රැගෙන යාමට කළ හැකි ක්‍රියාවන් **පහක්** විස්තර කරන්න.

7. පහත සඳහන් මාතෘකාවලින් **දෙකක්** තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.
i. නව ගිවිසුමේ පාස්කු භෝජනය
ii. ඔබේ මවට ද පියාට ද ගෞරව කරන්න.
iii. දේව රාජ්‍යයේ වටිනාකම් තුළින් ශ්‍රී ලංකාවේ සාරධර්ම ගොඩනගමු.
iv. සුවදානයේ දේව ප්‍රසාද නිධාන.

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2021(2022)
## කතෝලික ධර්මය 1
## පිළිතුරු

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 - | 03 | 11 - | 04 | 21 - | 03 | 31 - | 04 |
| 2 - | 02 | 12 - | 03 | 22 - | 01 | 32 - | 03 |
| 3 - | 02 | 13 - | 04 | 23 - | 02 | 33 - | 01 |
| 4 - | 04 | 14 - | 01 | 24 - | 04 | 34 - | 02 |
| 5 - | 01 | 15 | 03 | 25 | 01 | 35 - | 02 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 6 - | 01 | 16 - | 04 | 26 - | 03 | 36 - | 04 |
| 7 - | 02 | 17 - | 01 | 27 - | 02 | 37 - | 01 |
| 8 - | 04 | 18 - | 04 | 28 - | 03 | 38 - | 02 |
| 9 - | 02 | 19 - | 03 | 29 - | 04 | 39 - | 02 |
| 10 - | 03 | 20 - | 01 | 30 - | 01 | 40 - | 03 |

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2021 (2022)

## කතෝලික ධර්මය-II

1. (i) අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොතෙහි අන්තර්ගතයේ කොටස් දෙකක් ලියන්න.

❖ ධර්මදූත සේවාවට සූදානම් වීම. ❖ ජෙරුසලමෙහි සාක්ෂි දැරීම
❖ ජුදයේ හා සමාරියෙ හි සාක්ෂි දැරීම. ❖ ශුද්ධ වූ පාවුලු තුමාගේ ධර්මදූත සේවය.

(ii) ශුද්ධ වූ සභාව තුළ පැවතිය යුතු අනිවාර්ය ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.
❖ ඒකත්වය ❖ ශුද්ධත්වය ❖ කතෝලිකත්වය/සාධාරණත්වය ❖ අපෝස්තලිකත්වය

(iii) දිව්‍ය සත්ප්‍රසාද භෝජනයේ දී සක්‍රමේන්තු ආකාරයෙන් අප ලබා ගන්නේ කුමක් දැයි ලියන්න.
❖ ජේසුස් වහන්සේගේ ශ්‍රී ශරීරය. ❖ ජේසුස් වහන්සේගේ ශ්‍රී රුධිරය.

(iv) ඉඩමක් විකුණා ලබා ගත් මුදල් පිළිබඳ ව පේදුරු තුමන් රැවටීම නිසා මරණයට පත්වූ දෙදෙනා නම් කරන්න.
❖ අනනියස් ❖ සපීරා

(v) පූදසුන සූදානම් කිරීමේ පිළිවෙතට අයත් අනු කොටස් දෙක ලියන්න.

❖ පඬුරු පෙරහැර ❖ පඬුරු පිදීම ❖ පඬුරු මත යැදුම

(vi) දෙවියන් වහන්සේ ආබ්‍රහම් සමග ඇතිකර ගත් ගිවිසුමේ ප්‍රධාන කරුණු **දෙක** ලියන්න.
❖ අසංඛ්‍ය වූ දරු පරපුරක් ලබා දීම ❖ සදහට ම හිමිවන දේශයක් ලබා දීම

(vii) ප්‍රසාද ස්නාපනයේ දී ප්‍රකාශ කරනු ලබන පොරොන්දු **දෙක** ලියන්න.
❖ දෙවියන් වහන්සේව විශ්වාස කිරීම ❖ නපුර හා උගේ ක්‍රියා ප්‍රතික්ෂේප කිරීම

(viii) දේව රාජ්‍යයේ වටිනාකම් පිළිබඳ ව සඳහන් වන උපමා **දෙකක්** නම් කරන්න.
❖ වපුරන්නාගේ උපමාව ❖ කිරිදි පිළිබඳ උපමාව
❖ අබ ඇටය හා මුහුන් පිළිබඳ උපමා ❖ මුතුඇටය, නිධානය, දැල පිළිබඳ උපමා

(ix) එක්වරු ශීලය රැකීමේ පරමාර්ථ **දෙකක්** ලියන්න.
❖ තමන්ගේ පාපවලට වන්දි ගෙවීම ❖ ආත්ම දමනය පුහුණු කිරීම
❖ නිරාහාර ව දින හතළිහක් උපවාස කළ ක්‍රිස්තුන් වහන්සේ ව අනුගමනය කිරීම

(x) ජන වන්දනා වසර තුළ දේවමාතාවන්ගේ මංගල්‍යය **දෙකක්** සඳහන් කරන්න.
❖ ජනවාරි 01 - පාරිශුද්ධ දේව මාතාවන්ගේ මංගල්‍යය
❖ පෙබරවාරි 02 - කානික්ක මංගල්‍යය
❖ පෙබරවාරි 04 - ලංකා අප ස්වාමිදූගේ මංගල්‍යය
❖ මැයි 31 - මරිය තුමිය එළිසබෙත් තුමිය බැහැදැකීමේ මංගල්‍යය
❖ සැප්තැම්බර් 08 - මරිය තුමියගේ උපන් මංගල්‍යය
❖ අගෝස්තු 15 - මරිය තුමියගේ ස්වර්ගාරෝපණ මංගල්‍යය
❖ දෙසැම්බර් 08 - දේව මෑණියන්ගේ නිර්මල පිළිසිඳීමේ මංගල්‍යය

2. i. කතෝලික සභාව අනුගමනය කරන සහ උගන්වන කරුණු ලැබී ඇති මූලාශ්‍ර **දෙක** නම් කරන්න.
❖ ශුද්ධ බයිබලය ❖ ජීවන සභා සම්ප්‍රදාය

ii. පංච පුස්තකයට අයත් පොත් **තුනක්** නම් කරන්න.
❖ උප්පත්ති පොත ❖ නික්මයාම පොත ❖ලෙවී ව්‍යවස්ථාව ❖ගණන් කථාව ❖ද්විතීය නීති සංග්‍රහය

iii. නායකයෙකු වශයෙන් ඔබ කටයුතු කරන ආකාරය දස පනතේ පනත් **පහක්** ඇසුරින් කෙටියෙන් විස්තර කරන්න.

❖ සබත් දින ශුද්ධ ලෙස ගත කිරීම

ආගමික කටයුතුවල දී අන් අයට ආදර්ශයක් වෙමින්, වත්පිළිවෙත් ඉටු කිරීමේ දී සැබෑ එඬේරික නායකයකු සේ කටයුතු කිරීම.

❖ නුඹේ පියාට ද, මවට ද ගෞරව කිරීම

දෙමාපියන්ගේ හා වැඩිහිටියන්ගේ අත්දැකීම්වලට ගරු කරමින්, ඔවුන්ගේ ආශිර්වාදය හා මඟපෙන්වීම තුළ කටයුතු කිරීම.

❖ අන් සතු දේ සොරා ගැනීමෙන් වැළකීම.

තමාට අයත් නො වන අන් අයගේ දේපළ සොරා ගැනීමට කටයුතු නො කිරීම හා ඒවාට ආශා නො කිරීම.

❖ සැමවිට ම සත්‍යය වෙනුවෙන් සාක්ෂි දැරීම.

තමන් අනිත් සිදු වූ වැරදි අඩු පාඩුකම් වසා ගැනීමට බොරු කීම, සත්‍යය වසන් කිරීම ආදියෙන් වැළැකී සත්‍යයට සාක්ෂි දැරීම.

❖ ජීවිත ආරක්ෂා කිරීම

තමන්ගේ ජීවිතය මෙන් ම, අන් අයගේ ජීවිත ද ආරක්ෂා කිරීමට නිරතුරු ව කටයුතු කිරීම.
යහපත් දිවි පැවැත්මක් ඇති ව කටයුතු කිරීම.

❖ මර්යදාවට අනුව හැසිරීම.

❖ පෞද්ගලික හා පොදු දේපල ආරක්ෂා කිරීම.

❖ තමන්ගේ රටට ඉටුවිය යුතු සේවා ඉටු කිරීම.

❖ තම හෘද සාක්ෂියට එකඟ ව කටයුතු කිරීම.

3. i. පෙන්තකොස්ත මංගල්‍යයේ දී ජුදෙව්වන් විසින් කරන ලද විශේෂ ක්‍රියා **දෙකක්** ලියන්න.

❖ තිරිඟු අස්වැන්න නෙළීම ❖ නැඹුල් එල ඔප්පු කිරීම ❖ දස පනත සිහිපත් කිරීම.

ii. මුල් කිතුනු සභාවේ සුවිශේෂ ලක්ෂණ **තුනක්** ලියන්න.

❖ ප්‍රේරිතයන්ගේ ඉගැන්වීම.

❖ සහභාගිකම ( බෙදාගැනීම)

❖ රොටී කැඩීම ( දිව්‍ය පූජාව)

❖ යාච්ඤාව

❖ පොදුවේ තබා ගැනීම

iii. ඔබේ දේවස්ථාන මංගල්‍යයක දී ඔබට සිදු කළ හැකි යහපත් ක්‍රියා **පහක්** කෙටියෙන් විස්තර කරන්න.

❖ කොඩිගස එසවීමට සහය ලබා දීම.

❖ දේවස්ථානය, දේවස්ථාන භූමිය සුද්ද පවිත්‍ර කිරීම සඳහා සම්පූර්ණ දායකත්වය ලබා දීම.

❖ පාපවලට සැබෑ ලෙස මනස්ථාප වී යහපත් පාපොච්චාරණයක් (සමඟි සන්ධානය) කිරීම.

❖ මංගල්‍යයට පෙර පවත්වන නුවානවලට භක්තියෙන් සහභාගි වීම.

❖ දේවස්ථානයේ කටයුතුවලට උදව් වීම. (උදා - සැරසිලි, මළවුන් සිහි කර දෙන දාන).

- ❖ මංගල්‍යය සාර්ථක කර ගැනීම සඳහා ආධ්‍යාත්මික වැඩසටහන් සංවිධානය කිරීමට මීසම් පාලක පියතුමාට සහය වීම.
- ❖ මංගල්‍යයෙන් පසුව ද දේවස්ථානය හා භූමිය සුද්ද පවිත්‍ර කිරීමට දායකත්වය ලබා දීම.

4. i. ගෙත්සමනි මල් උයනේ යාච්ඤාවෙන් පෙන්නුම් කරන කරුණු **දෙකක්** ලියන්න.

- ❖ ජේසුස් වහන්සේගේ සැබෑ මනුෂ්‍යත්වය.
- ❖ දෙවියන් වහන්සේ හා ක්‍රිස්තුන් වහන්සේ අතර ඇති සබැඳියාව.
- ❖ ජේසුස් වහන්සේගේ දුක්ප්‍රාප්තිය.
- ❖ ජීවිතයේ සෑම අවස්ථාවකට ම යාච්ඤාවෙන් සූදානම් විය යුතු බව.

ii. ගෙත්සමනි මල් උයනේ දී ජේසුස් ක්‍රිස්තුන් වහන්සේට ආසන්නයේ සිට යාච්ඤා කිරීමට උන්වහන්සේගෙන් උපදෙස් ලැබූ අපෝස්තුළුවරුන් **තිදෙනාගේ** නම් ලියන්න.

- ❖ පේදුරු අපෝස්තුළු තුමා
- ❖ ජුවාම් අපෝස්තුළු තුමා
- ❖ ජාකොබ් අපෝස්තුළු තුමා

iii. දුර්පරීක්ෂාවලින් ජය ගැනීමට අවශ්‍ය ශක්තිය ඉල්ලා නිර්මාණය කරන පෞද්ගලික යාච්ඤාවක අඩංගු විය යුතු කරුණු **පහක්** ලියන්න.

- ❖ දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාසය තැබීම.
- ❖ උන්වහන්සේ කෙරෙහි බලාපොරොත්තු තැබීම.
- ❖ උන්වහන්සේට ප්‍රේම කිරීම.
- ❖ තම දුර්වලතා හඳුනාගෙන ඒවා පිළිගැනීම.
- ❖ තමා අතින් සිදු වූ වැරදිවලට සමාව අයැදීම.
- ❖ තම අවශ්‍යතා ඉල්ලීම.
- ❖ පරීක්ෂා ජය ගැනීමට වරම් අයැදීම, දේව ආරක්ෂාවට භාර වීම.

(පෞද්ගලික යාච්ඤාවකට අඩංගු විය යුතු මෙවැනි කරුණු **පහක්** හෝ මෙවැනි කරුණු ඇතුළත් කර යාච්ඤුවක් ලියන්න.)

5. i.ස්නාවක ජොහන් තුමා පිළිබඳ ව පැරණි ගිවිසුමේ මලාකි 3:1 හා නව ගිවිසුමේ ලූක් 1:6 හි සඳහන් වූ කරුණු **දෙක** ලියන්න.

❖ පැරණි ගිවිසුමේ (මලාකි 3:1)

''මට පෙරටුව ගොස් මාගේ මාර්ගය පිළියෙළ කරන්නා වූ මාගේ දූතයා මම එවන්නෙමි.''

❖ නව ගිවිසුමේ (ලූක් 1:16)

''ඔහු ඉශ්රායෙල්වරුන් බොහෝ දෙනෙකු ඔවුන්ගේ දෙවි ස්වාමින් වහන්සේ වෙත හරවන්නේ ය.''

ii. ස්නාවක ජොහන් තුමාගෙන් උපදෙස් ලැබූ කණ්ඩායම්වලට එතුමා දුන් අවවාද **තුනක්** සඳහන් කරන්න.

❖ ජනතාවට - අඳන දෙකක් ඇති අය නැති අයට දෙත්වා.

(ලූක් 3:1) - කෑම ඇති අය කෑම නැති අයට දෙත්වා.

❖අයකැමියන්ට (ලූක් 3:13) - නියමිත පමණට වැඩියෙන් අයබදු නො ගන්න.

❖ සෙබළුන්ට (ලූක් 3:14) - කිසිවෙකුගෙන් බලහත්කාරයෙන්වත් බොරු චෝදනා නැඟීමෙන්වත් කිසිවක් පැහැර නො ගන්න.

- ඔබට ලැබෙන වැටුපෙන් සෑහී සිටින්න.

iii. ස්නාවක ජොහන්තුමාගේ ජීවිතයෙන් අද සමාජයේ ජන නායකයින්ට ගත හැකි ආදර්ශ **පහක්** විස්තර කරන්න.

❖ස්නාවක ජොහන් තුමා මෙන් යුක්තිගරුක ව සාධාරණ ව තම යුතුකම් හා වගකීම් නො පිරිහෙළා ඉටු කිරීම.
❖ රටවැසි ජනතාව වෙනුවෙන් නිරතුරුව ම යුක්තියට සාක්ෂි දැරීම.
❖ රටේ අනාගත සංවර්ධනයට නායකයා සේවකත්වයෙන් යුතුව වැඩ කටයුතු කිරීම.
❖ මානව දයාව හා පොදු යහපත පෙරදැරි ව රටේ යහපත වෙනුවෙන් වැඩ කටයුතු කිරීම.
❖ රටේ සම්පත් සෑම කෙනෙකුට ම ලැබෙන පරිදි සාධාරණ ව බෙදා හැරීමට කටයුතු කිරීම.
❖ ජාති, ආගම්, කුළ භේද නොතකා සෑම කෙනාව ම මනුෂ්‍යත්වයෙන් සලකා සෑම දෙනාට ම එක ලෙස සැළකීම.
❖ ජනතාවගේ දුකට සංවේදී වීම හා ජන මතයට ගරු කිරීම

6. i. මතෙව් 5:44 අනුව ස්වර්ගයෙහි වැඩ වසන ඔබේ පියාණන් වහන්සේගේ පුත්‍රයන් වන්නට කළ යුතු ක්‍රියාවන් **දෙකක්** ලියන්න.

❖ ඔබේ සතුරන්ට ප්‍රේම කරන්න.
❖ ඔබට පීඩා කරන්නන් උදෙසා යාච්ඤා කරන්න.

ii. යුද්ධය පිටුදැකීම පිළිබඳව කතෝලික සභාව උගන්වන කරුණු **තුනක්** සඳහන් කරන්න.

❖ යුද්ධය හා අවිආයුධ රැස්කිරීම භයානක බව.
❖ යුද්ධය සඳහා වියදම් කරන මුදල්වලින් ලෝකයේ දිළිඳු භාවය තුරන් කළ හැකි බව.
❖ යුද්ධය ප්‍රතික්ෂේප කිරීම හා ඇතුළාන්ත සාමය ගොඩනගා ගැනීම ක්‍රිස්තියානි යුතුකම බව.
❖ අවි ආයුධ නිපදවීම හා යුද්ධය පිටු දැකීමට විවිධ සංවිධාන කටයුතු කළ යුතු බව.

iii. වර්තමාන සමාජය 'සාම මාවතක් කරා' රැගෙන යාමට කළ හැකි ක්‍රියාවන් **පහක්** විස්තර කරන්න.

❖ යුක්තිය, සාධාරණත්වය, දයාව සමාජය තුළ ගොඩනැගීම.
❖ ප්‍රචණ්ඩ ක්‍රියා ප්‍රතික්ෂේප කිරීම.
❖ මිනිස් ඝාතන නො කිරීමට වග බලා ගැනීම.
❖ මිනිස් අයිතිවාසිකම් සුරැකීම.
❖ දුබලයන් ආරක්ෂා කිරීම.

(මෙවැනි කරුණු **පහක්** ලියා විස්තර කරන්න.)

7. පහත සඳහන් මාතෘකාවලින් **දෙකක්** තොරාගෙන කෙටි සටහන් ලියන්න.

i. නව ගිවිසුමේ පාස්කු භෝජනය

- ❖ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ විසින් මහ බ්‍රහස්පතින්දා දින සිදු කරන ලදී.
- ❖ එදින දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ස්ථාපනය කරන ලදී.
- ❖ පූපය රැගෙන එය උන්වහන්සේගේ ශ්‍රී ශරීරය බවට පත්කළ සේක.
- ❖ මිදි යුෂ රැගෙන එය උන්වහන්සේගේ ශ්‍රී රුධිරය බවට පත්කළ සේක.
- ❖ උන්වහන්සේ සිහිවීම පිණිස මෙය සිදු කරන ලෙස ඉල්ලා සිටින සේක.
- ❖ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ මගින් උන්වහන්සේ සදහට ම අප සමග වැඩ සිටින සේක.
- ❖ මෙමගින් පුරාණ ගිවිසුමේ පාස්කු බැටළුවාගේ තැන උන්වහන්සේ ගත් සේක.
- ❖ පසු දින තම ජීවිත යාගය මගින් නව ගිවිසුමේ බැටළුපෝතකයාණෝ වූ සේක.
- ❖ ප්‍රේමයේ පනත ස්ථාපිත කිරීම ( පාද සේදීම )

(මෙවැනි කරුණු **පහක්** ලියා විස්තර කරන්න.)

**(ii)** ඔබේ මවට ද පියාට ද ගෞරව කරන්න.

- ❖ දෙමාපිය වැඩිහිටියන් සැලකීම දේව පනතකි.
- ❖ ඔවුන්ට අගෞරව කිරීමෙන් වැළැකී සිටිය යුතුයි.
- ❖ මව්පියන් හුදකලා කිරීම සිදු නො කළ යුත්තකි.
- ❖ ඔවුන්ගේ බලාපොරොත්තු හැකිතාක් දුරට ඉටුකරීමට කටයුතු කළ යුතුයි.
- ❖ ගුරුවරුන්ට හා වැඩිහිටියන්ට කීකරු විය යුතුයි.
- ❖ ඔවුන්ගේ සිත් රිදවීමෙන් වැළැකී සිටිය යුතුයි.
- ❖ ඔවුන්ගේ වස්තුව විනාශ නො කළ යුතුයි.

(මෙවැනි කරුණු **පහක්** ලියා විස්තර කරන්න.)

**(iii)** දේව රාජ්‍යයේ වටිනාකම් තුළින් ශ්‍රී ලංකාවේ සාරධර්ම ගොඩනගමු.

❖ ලෝකයේ ආලෝකය සතුරන් කෙරෙහි මෙත් සිත් වැඩීම. ❖වැඩිහිටියන්ට ගෞරව කිරීම.

❖ අන් අයට දයාවන්ත වීම. ❖සරල සිතිවිලි ඇතිකර ගැනීම. ❖ යුක්තිගරුක වීම.

❖ සාමයට සාපිපාසාවෙන් සිටීම.❖පළි නො ගැනීම. බෙදාහදා ගැනීම.

❖වරදක් වූ විට සමාව අයැදීම.

<u>ශ්‍රී ලංකාවේ සාරධර්ම</u>

- ❖ දෑත් එක්කර "ජේසු පිහිටයි !" කීම.
- ❖ නිවසින් බැහැර ව යාමට පෙර සහ සෑම වැදගත් කාර්යයකට ම පෙර කුරුසියේ ලකුණ ඇඳීම හෝ යාච්ඤාවක් කීම.
- ❖ දෙමාපියන්ට ගුරුවරුන්ට හා වැඩිහිටියන්ට වැඳීම.
- ❖ අන් අයගේ පෞද්ගලික කථාවලට සවන් නොදීම.
- ❖ වැඩිහිටියෙක් පැමිණි විට අසුනින් නැගිටීම.
- ❖ වැඩිහිටියන්ට ඉහළින් වාඩි නො වීම.
- ❖ අත් වැරැද්දක් වූ විට සමාව ඉල්ලීම.
- ❖ අගන්තුක සත්කාරය.

(දේව රාජ්‍යයේ ගුණාංග ශ්‍රී ලංකාවේ සාරධර්ම හා සම්බන්ධ කර කරුණු **පහක්** ලියන්න.)

**(iv)** සුවදානයේ දේව ප්‍රසාද නිධාන.

- ❖ සුවදානයේ දේව ප්‍රසාද නිධාන දෙකකි. එනම්,

- සමඟි සන්ධානය
- රෝගීන්ගේ ආලේපය.

❖ මෙම ප්‍රසාද නිධාන දෙක තුළින් සිත් හැරීම සිදු වේ. පව් සඥහා ගැඹුරු මනස්ථාපයක් ඇති වේ.

❖ ස්වර්ගීය ජීවිතයට හිමිකම රැකගත හැකිය. බිඳ වැටුණු සබඳතා නැවත ගොඩනැගේ.

❖ ඇතුළාන්ත සැනසීම අත්දැකිය හැකි ය.

❖ රෝගී බවේ වේදනාව සංසිඳේ.

❖ විශ්වාසය සහ බලා පොරොත්තුව වර්ධනය වේ.

(මෙවැනි කරුණු **පහක්** විස්තර කරන්න )